ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු - ESU3213

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.02.01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. තුලනාත්මක අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය කෙටියෙන් විග්‍රහ කරන්න.

02. පාලනය අනුව බ්‍රිතාන්‍ය පාසල් වර්ග කර ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. "සංවර්ධිත රටවල අධ්‍යාපනයට එල්ල වී ඇති ප්‍රධාන අභියෝගයක් නම් තාක්ෂණය හා එක්ව ගමන් කිරීමයි."

    අධ්‍යාපන ක්‍රියාවලිය තුළ තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව සංවර්ධිත රටවල් මුහුණ දෙන අභියෝග තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

04. රටක අධ්‍යාපන පද්ධතියෙහි බාහිර කාර්යක්ෂමතාව හා බුද්ධි ගලනය අතර ඇති සබඳතාව කෙටියෙන් පහදන්න.

05. ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලන සමයෙහි පැවති අධ්‍යාපන ආයතන තුනක් (03) නම් කර ඉන් එක් අධ්‍යාපන ආයතනයක විෂය මාලාවෙහි වැදගත්කම පැහැදිලි කරන්න.

06. අධ්‍යාපනය පිළිබඳ 1943 විශේෂ කමිටුව විසින් යෝජිත පශ්චාත් ප්‍රාථමික පාසල් ව්‍යුහය කෙටියෙන් පැහැදිලි කරන්න.

07. 1961 ජයසූරිය අධ්‍යාපන කොමිෂන් වාර්තාවෙහි සඳහන් නිර්දේශ පහක් (05) දක්වන්න.

08. ශ්‍රී ලංකාවේ පාසල් පාදක ඇගැයීම් ක්‍රියාවලියෙහි දක්නට ලැබෙන ධනාත්මක ලක්ෂණ තුනක් **(03)** සහ සෘණාත්මක ලක්ෂණ දෙකක් **(02)** සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## <u>2 වන කොටස</u>

09. (i) සුළු ජන භාෂා පවත්වාගෙන යාම හා සංවර්ධනය කිරීම සඳහා රුසියාව (සෝවියට් දේශය) විසින් ගනු ලැබූ පියවර හතරක් **(04)** නම් කරන්න.

(ලකුණු 04)

(ii) ඉහත අංක (i) යටතේ ඔබ සඳහන් කළ එක් **(01)** පියවරක් අගයන්න.

(ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවෙහි සුළුජන කණ්ඩායම් විසින් භාවිතා කරන භාෂා රැක ගැනීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් ගත හැකි පියවර පහක් **(05)** පැහැදිලි කරන්න.

(ලකුණු 10)

10. (i) සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින අධ්‍යාපන ගැටලු හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත අංක (i) යටතේ ඔබ සඳහන් කළ ගැටලු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(iii) සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවෙහි අධ්‍යාපනයේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව පිළිබඳව පවතින ගැටලු විසඳීම සඳහා යෝජනා හතරක් **(04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

11. (i) "ගෝලීයකරණය පශ්චාත්-යටත්විජිත යුගයෙහි ඇති වූ සංසිද්ධියකි." ගෝලීයකරණය යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) ගෝලීයකරණය ශ්‍රී ලංකාවට බලපා ඇති ආකාරය

(අ) ධනාත්මක ප්‍රතිඵල තුනක් **(03)**

(ආ) සෘණාත්මක ප්‍රතිඵල දෙකක් **(02)**

සඳහන් කරමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) ඉහත (ii) (ආ) හි ඔබ සඳහන් කළ සෘණාත්මක ප්‍රතිඵල මගහරවා ගැනීම සඳහා යෝජනා දෙකක් **(02)** ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

12. (i) අධ්‍යාපනය පිළිබඳ 1867 මෝර්ගන් කමිටු වාර්තාවෙහි සඳහන් නිර්දේශ හතරක් **(04)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04)

(ii) ඉහත අංක (i) යටතේ ඔබ සඳහන් කළ එක් **(01)** නිර්දේශයක් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමය තුළ මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරී වූ මිෂනාරි කණ්ඩායම් පහක් **(05)** නම් කර, රටෙහි අධ්‍යාපනය කෙරෙහි එම කණ්ඩායම්වල දායකත්වය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) උසස් අධ්‍යාපනය ප්‍රතිසංවිධානය කිරීම සඳහා වූ 1971 ජයරත්න කමිටුව විසින් ඉදිරිපත් කරන ලද එක් ප්‍රධාන නිර්දේශයක් වූයේ වෘත්තීය නැඹුරු පාඨමාලා හඳුන්වා දීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1972 සිට විශ්වවිද්‍යාල මට්ටමෙහි පාඨමාලා ලෙස හඳුන්වා දෙන ලද වෘත්තීය විෂය ක්ෂේත්‍ර හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් කරන ලද පරිදි 1972 සිට අරඹන ලද වෘත්තීය නැඹුරු පාඨමාලාවල සාර්ථක/අසාර්ථක බව කෙටියෙන් විමසන්න. (ලකුණු 08)

(iii) වර්තමානයෙහි ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් පවත්වනු ලබන වෘත්තීය නැඹුරු පාඨමාලාවල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ඔබගේ යෝජනා හතරක් **(04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

14. (i) වර්තමානයෙහි ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන අධ්‍යාපනික ගැටලු හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත අංක (i) යටතේ ඔබ සඳහන් කළ එක් **(01)** ගැටලුවක් පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iii) ඔබ විසින් ඉහත සඳහන් කරන ලද එක් **(01)** ගැටලුවක් විසඳීම සඳහා ශ්‍රී ලංකාව තුළ දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග පහක් **(05)** විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**BACHELOR OF EDUCATION (NATURAL SCIENCE) DEGREE PROGRAMME**

**LEVEL - 05**

**FINAL EXAMINATION 2018**

**ESU3213 – COMPARATIVE EDUCATION & EDUCATIONAL PROBLEMS**

**DURATION – THREE (03) HOURS**

| Date: 01.02.2018 | Time: 9.30 a.m. – 12.30 p.m. |
|---|---|

**Answer All Questions in Part I and any Three (03) questions from Part II.**

## PART - I

01. Describe in brief the scope of the subject of Comparative Education.

02. Explain in brief the classification of British schools according to control.

03. "A major challenge confronting education in the developed countries is to keep pace with technology".

    Describe in brief **three (03)** challenges faced by developed countries in using technology in the process of education.

04. Explain in brief the relationship between the external efficiency and 'Brain Drain' of a country.

05. Name **three (03)** educational institutes that existed during the period of Portuguese rule in Sri Lanka, and explain the importance of the curriculum of one of those institutes.

06. Briefly explain the post-primary school structure proposed by the Special Committee on Education of 1943.

07. State **five (05)** recommendations of the Jayasuriya Education Commission Report of 1961.

08. Mention **three (03)** positive and **two (02)** negative characteristics of the School Based Assessment (S.B.A) process in Sri Lanka.

(5 x8 = 40 marks)

## PART - II

09. i. Name **four (04)** steps taken by Russia (the Soviet) to sustain and develop the minority languages.

(04 marks)

ii. Evaluate **one (01)** of the steps mentioned by you under number (i) above.

(06 marks)

iii. Explain **five (05)** steps that can be taken as policy decisions to sustain the languages used by the minority communities in Sri Lanka.

(10 marks)

10. i. State **four (04)** educational problems prevalent in developing countries.

(04 marks)

ii. Explain in brief the problems mentioned by you under number (i) above.

(08 marks)

iii. Give **four (04)** suggestions to solve problems related to the internal efficiency of education in Sri Lanka as a developing country.

(08 marks)

11. i. "Globalization is a phenomenon that emerged in the post-colonial era." Define the concept of Globalization.

(04 marks)

ii. Explain in brief the manner in which globalization has affected Sri Lanka mentioning:

a. three (03) of its positive effects
b. two (02) of its negative effects

(10 marks)

iii. Give **two (02)** suggestions to overcome the negative effects mentioned by you under **(ii) b** above.

(06 marks)

12. i. List **four (04)** recommendations in the Morgan Committee Report of Education of 1867.

(04 marks)

ii. Evaluate **one (01)** of the recommendations mentioned by you under number (i) above.

(06 marks)

iii. Name **five (05)** groups of Missionaries who were actively involved in the field of education in Sri Lanka during the British colonial rule, and describe in brief the contribution of those groups to education within the country.

(10 marks)

13. i. One of the key recommendations of the Jayaratne Committee for Re-organizing Higher Education of 1971 was to introduce job-oriented courses. Name four (04) job-related subject areas which were consequently introduced from 1972 onwards as courses at university level.

(04 marks)

ii. Examine in brief the success/failure of the job-oriented courses initiated from 1972 onwards as mentioned above.

(08 marks)

iii. Present **four (04)** suggestions of your own to enhance the quality of job-oriented courses which are currently being conducted by Sri Lankan state universities.

(08 marks)

14. i. State **four (04)** main educational problems faced by Sri Lanka at present.

(04 marks)

ii. Examine **one (01)** problem mentioned by you under number (i) above.

(06 marks)

iii. Analyze **five (05)** measures already taken in Sri Lanka to solve **one (01)** problem mentioned by you above.

(10 marks)

*-Copyrights reserved-*